www.kidworship.kr

# යෝසෙප් 1

\- 12nd Story-



80Page

**පොතේ ගුරා** යාකොබ්ට දරුවන් 12 දෙනෙකු සිටියා. නමුත් මේ දරුවන් 12 දෙනාගෙන් 11 වෙනියා වූ යෝසෙප්ට ඔහු වැඩියෙන් ආදරය කළා.
යාකොබ් යෝසෙප්ට ආදරේ වූ නිසා අනිත් දරුවන් 12 දෙනා ඉදිරියේ වටිනා සළුවක් ඔහුට හැන්දෙව්වා. මෙය දුටු යෝසෙප්ගේ සහෝදරයන් ඔහුට ඊර්ෂ්‍යා කරන්නට පටන් ගත්තා.

.........................................................................................



81Page

**පොතේ ගුරා** යෝපෙස් සාමාන්‍යයෙන් දිනපතාම හෝ ඉඳහිට හීන දකින කෙනෙක්. දවසක් ඔහු දැකපු හීනයක් ඔහුගේ සහෝදයන්ට කීවා.

**යෝසෙප්** අයියාලා මේ අහන්න, මම ඊයේ රෑ හීනයක් දැක්කා.
මිටි බැඳපු ගොයම් කරල් මගේ ඉදිරියේ තිබුණා. ඒවා ඔක්කොම නැමී මට වැන්දා. තවත් හීනයක් මම දැක්කා ඒ හීනයේ ඉර, සඳ හා තරු 11ක් මට නැමිලා වැන්දා.

**1 සහෝදරයා** මොනවා !! ඔයා මේ කියන්නේ අපි ගැනද?
ඔයාට මෙහෙම කියන්න පුළුවන් කොහොමද? මෝඩ අදහස්...

**යාකොබ්** ඒ කොහොමද? මමත් අම්මත් ඔයාගේ අයියලත් ඔක්කොම ඔයාට වඳින්න ඕනද? අයොත් මේ වගේ කතාවන් නම් කියන්න එපා.

**පොතේ ගුරා** යෝසෙප් විසින් කියන මේ හීනයන් ඇසූ යෝසෙපග්ගේ සහෝදරයන් ඔහුට වඩා වඩා වෛර කරන්නට වුණා. යෝසෙප් ගේ පියාත් ඔහු සමග ටිකක් අමනාපයෙන් පසු වුණා. නමුත් යෝසෙප්ගේ පියා මේ හීනය අමතක කළේ නෑ.

.........................................................................................



82Page

**පොතේ ගුරා** එක දවසක් බැටළු රැළ බලාගනිමින් වනාන්තරයේ සිටින යෝසෙප්ගේ සහෝදරයන් සුවසේ සිටින්නේදැයි බලා එන්නැයි යකොබ් යෝසෙප් ට කීවා.

**1 සහෝදරයා** ඒයි... ආ..න්න හීනකාරයා යෝපෙස් එනවා.
එන්න අපි ඔහුව අල්ලා මරලා මේ ළිඳට දාමු.

**රූබන්** නෑ අපි එයාව මරන්න ඕන නෑ. එයාගේ ලේ හලන්න ඕන නෑ.
අපි එයාව අල්ලලා මේ ළිඳ ඇතුළට දාමු.

**පොතේ ගුරා** යෝසෙප් සහෝදරයන්ට යෝසෙප්ව මරන්නට හොඳටම උවමනාව තිබුණත් රූබන් නිසා ඒ අදහස අත් හැරියා. නමුත් යෝසෙප්ගේ වටිනා සළුව ගළවා ගත් ඔවුන් යෝසෙප් ඇද ළිඳ ඇතුළට වීසි කළා.
යෝසෙප් ළිඳෙන් එගොඩට ඒමට උදව් ඉල්ලා කෑ ගැසුවත් ඔහුගේ සහෝදයන් එය ප්‍රතික්ෂේප කළා.

**1 සහෝදරයා** අපි මූව මරන්න හොඳ නෑ. අපි මූව කාටහරි විකුණමු.


**2 සහෝදරයා** ඔව් ඔව් අපි එහෙම කරමු.



83Page

| | |
|---|---|
| පොතේ ගුරා | මිදියන් වෙළෙන්දන් ඔවුන් අසලින් යනවා දුටු යෝසෙප්ගේ සහෝදරයන් යෝසෙප්ව වළෙන් ඇද ගොඩට ගෙන මේ ඉශ්මායෙල් වෙළෙන්දන්ට රිදී කාසි 20 කට යෝසෙපව් විකුණුවා. ඔවුහු යෝසෙප්ගේ සළුව ගෙන එළුවෙකු මරා සළුව ලෙයෙහි ගල්වා අත්දිට ඒ වස්ත්‍රය පියාණන් වෙතට ගෙනැවිත් පෙන්නුවා. |
| 1 සහෝදරයා | තාත්තේ මේ බලන්න චන්ඩ මෘගයෙක් යෝසේව මරා කාලා. |
| යාකොබ් | මොකක් !!! යොසෙප් මැරුණා. මේ ඇත්තමද කියන්නෙ"???? |
| 2 සහෝදරයා | ඔව් තාත්තේ !! අපිට ඔහුගේ සළුව ලැබුණා. |
| යාකොබ් | නෑ නෑ.. යෝසෙප් ... අනේ යෝසෙප්... යෝසෙප්...<br>ඔයා නැතිව මම ජීවත්වෙන්නේ කොහොමද යෝසෙප් ..... ඉහිහි ඉහිහි.. |


.................................................................................................



84Page

| | |
|---|---|
| පොතේ ගුරා | යෝසෙප් මිසරයට ගෙන ගියේය. ඵාරාවොගේ ඇමතියෙක්ද, රැකවලුන්ගේ නායකයෙක්ද වූ පොතිඵර් ඔහු ගෙන ගිය ඉශ්මායෙල්-වරුන්ගෙන් ඔහු මිලේට ගත්තා. යෝසෙප් සඵලවත් මනුෂ්‍යයෙක්ව ඉතාම හොඳින් වැඩ කරන්නෙක්ව සිටි නිසා පොතිඵර් ඔහුව තමාගේ නිවසට ඔහු ප්‍රධානියා කොට ඔහුට සියල්ලම බාරදුන්නා.<br>නමුත් පොතිඵර්ගේ භාර්යාව විසින් කරන ලද චෝදනාවකට මුහුණ දෙන්නට යෝසෙප්ට සිදු වුණා. |
| පොතිඵර්ගේ භාර්යාව | අයියෝ අයියෝ පොතිඵර් .... මේ බලන්න.<br>මේ යෝසෙප් මට ඉතාම නරක දෙයක් කරන්න හැදුවා.<br>කරුණාකරලා මෙයාට නිසි දඬුවම් ලබා දෙන්න. |
| පොතිඵර් | මොනවා !!!<br>එයා කොහොමද මගේ භාර්යාවට මෙහෙම දෙයක් කරන්නේ ??<br>සේවකයිනි ... මේ දැන්ම.. ඕව් !!<br>මේ දැන්ම... යෝසෙප් ගෙන ගොස් හිර කුඩුවට දමන්න. |
| පොතේ ගුරා | පොතිඵර් ඔහුගේ භාර්යාවගේ බොරුව විශ්වාස කළා.<br>යෝසෙප්ව අරන් රජුගේ හිරකාරයන් දමා තිබූ හිරගෙට දැම්මා. |

.................................................................................................



85Page

| | |
|---|---|
| පොතේ ගුරා | මෙතරම් බොරුවක් කොට යෝසෙප් හිරගෙට දැමුවත් යෝසෙප් මේ සිදුවෙන දේවල් ගැන එතරම් හිතුවේ නෑ. කාලයකට පසුව රජුගේ කුසලාන දරන්නාද, පූප දරන්නාද යන දෙදෙනාත් රජුට එරෙහිව කළ වරදක් නිසා මේ හිරගෙටම දැමුවා. එක දවසක් මේ දෙන්නාම ඉතා දුකින් මලානිකව සිටිනවා යෝසෙප් දැක්කා. |
| යෝසෙප් | ඔයාලා ඉතාම ශෝකයෙන් මලානිකව ඉන්නේ ඇයි ?? |
| කුසලාන දරන්නා | මම ඉතාම බය හීනයක් දැක්කා. හීනෙන් මුදිකවැලක් මා ඉදිරියෙන් තිබුණා. ඒ මුදික වැලේ අතු 3ක් තිබුණා.<br>ඒක දළු දමා එහි මල් හටගත්තා. එහි වලුවල ඉදිණු මිදිඵල තිබුණා.<br>ඵාරාවෝගේ කුසලාන මා අතේ තිබුණා.<br>මම මිදික ඵල කුසලනයට මිරිකා එය ඵාරාවෝ අතට දුන්නා. |

යෝසෙප් එකේ තේරුම් නම් මේ වගේ. අතු 3 නම් දවස් 3ක් ය.
තව දවස් 3කින් ඵාරාවෝ රජතුමා ඔබව නිදහස් කරලා නැවතත් ඔයාගේ ධූරයට ඔයාව පත් කරයි. නැවතත් ඔබ ඵාරාවෝට කුසලාන දරන්නාව සේවය කරන්නට යන්නේ ය. නුඹට සුබසිද්ධ වුණාම මටත් කරුණාව පෙන්වා ඵාරාවෝට මේ ගැන සඳහන් කර මාවත් මේ හිරගෙයින් නිදහස් කර ගන්න.


පූප දරන්නා ඔහ්... ඔයා හීන පරිවර්ථනය කරනවා නේද? කරුණාකරලා මටත් සවන් දෙන්න. මම රජතුමාගේ පූප දරන්නා. මගේ හිස පිට සුදු රොටී පෙට්ටි 3ක් තිබුණා. ඉහළම පෙට්ටියේ ඵාරාවෝට සාදන ලද සියලු ආකාර පූප තිබුණා. පක්ෂිහු මගේ හිස පිට තිබුණ පෙට්ටියෙන් ඒවා කෑවා.

යෝසෙප් ඒ හීනයෙ"අර්ථය නම් මේවගේ. පෙට්ටි 3 නම් දවස් 3 ක් ය. 3 දවසක් ඇතුළත ඵාරාවෝ නුඹව එල්ලුම්ගහට නියම කරන්නේ ය.

පූප දරන්නා මොනවා !! එහෙම වෙයි ද?

පොතේ ගුරා යෝසෙප් කී ආකාරයෙන්ම තුන් දවසකින් කුසලාන දරන්නාව සිටි මිනිසා ඔහුගේ නිලයට නැවත පත් කළා. එසේ වුණත් කුසලාන දරන්නා යෝසෙප්ව සිහි නොකොට ඔහුව අමතක කළා.

......................................................................................



86Page

පොතේ ගුරා සම්පූර්ණ වසර 2ක් ගත වුණා. ඵාරාවෝ හීන දෙකක් දුටුවා.
පළමු හීනය නම් පෙනීමට ලස්සන මාංශයෙන් තරවූ එළදෙනුන් 7 දෙනෙක් ගංගාවෙන් නැගී ඇවුත් පන් ගස් අතරේ කමින් සිටියා.
උන්ට පසුව අවලක්ෂණ මාංශයෙන් කෙට්ටු වූ එළදෙනුන් 7 දෙනෙක් ගංගාවෙන් නැගී අවුත් ගං ඉවුරේ අනික් එළදෙනුන් ළග සිටියා.
දෙවන හීනය නම් තර වූ හොඳ ගොයම් කරල් 7ක් එක ගසක හට ගත්තා. ඉන් පසුව හීන් වූ පෙරදිග සුළඟින් වියළී ගියාවූ කරල් 7ක් හැදුනා.
මේ හීන් වූ කරල් සම්පූර්ණ තරවූ කරල් 7 ගිල ගත්තා.

ඵාරාවෝ මොනවද මේ අමුතු හීන ??
සියලු මායම්කාරයන් හා සාස්ත්‍රකාරයන් කැඳවලා මේ හීන ගැන අසන්න.

පොතේ ගුරා නමුත් මේ හීන තෝරන්නට කිසිවෙකටු නොහැකි වුණා.
මේ වෙලාවේදී රජුගේ කුසලාන දරන්නාට, තමන් හිරගෙයි සිටියදී තමුන්ගේ හීනය තෝරා දුන්නු යෝසෙප්ව මේ වෙලාවේදි මතක් වුණා.

කුසලාන දරන්නා රජතුමනි !! ඔබවහන්සේගේ හීනය තෝරන්නට පුලුවන් ප්‍රඥාවන්තයෙක් ගැන මම දන්නවා.

පොතේ ගුරා රජු යෝසෙප්ව ගෙනෙන්නට අණ කළා. දේව ප්‍රඥාවෙන් පිරී සිටි යෝසෙප් පැමිණ ඵාරාවෝගේ හීනවල අර්ථය කියා දෙන්නට වුණා.

යෝසෙප් මේ හීන දෙකේම ඇත්තේ එකම තේරුමක් ය. දෙවියන්වහන්සේ තමන් කරන්නට යන දේ ඔබට ප්‍රකාශ කර ඇත්තේ ය. හොඳ සාරවත් වසර 7කට පසුව, සාගත අවුරුදු 7ක් පැමිණෙන්නට යනවා. මුලු රටේම සාරවත්කම නැතිවෙනවා. හොඳ අවුරුදු 7 තුළදි ආහාර ගබඩා කර රැස්කර ගත යුතුයි. මේ රැස්කිරීම හේතුවෙන් සාගත අවුරුදු ජය ගැනීමට පලුවන් වෙයි. ඒ නිසා දැනුම් තේරුම් ඇති ප්‍රඥාවන්ත මනුෂ්‍යයෙකු සෙයා මේ වැඩයට ඔහුව පත් කරන්න.

පොතේ ගුරා මේ සියල්ලම ගැන නුඹ තරම් ප්‍රඥාවන්ත දැනුම් තේරුම් ඇති මනුෂ්‍යයෙක් තවත් නැතැයි කී ඵාරාවෝ යෝසෙප් ව මේ තනතුරට පත් කරන ලදි.





**ඵාරාවෝ**
නුඹ සැබෑවටම දෙවියන්වහන්සේගේ මිනිසෙක්. දෙවියන්වහන්සේ
මේ සියල්ලම නුඹට දන්වා තිබෙනවා.
නුඹ මෙන් ඥානවන්තයෙක් තවත් නැති තරම්..!!

**පොතේ ගුරා**
ඵාරාවෝ තමන්ගේ අතේ තිබුණු පෙරැස් මුද්ද ගළවා යෝසෙප්ගේ අතේ
දැමුවේ ය. යෝසෙප් මුලු දේශයේ අධිපතියා බවට පත් වුණා.
දෙවියන්වහන්සේ යෝසෙප්ට හීනයක් ලබාදුන් අතර එම
හීනය සැබෑවන්නටද සැලැස්සූ සේක. ඉශ්රායෙල් ජාතියත් මුදවා ගන්නා
පිණිස දෙවියන්වහන්සේ කලින්ම යෝසෙප්ව මිසරයට යැවූ සේක.
මේ සියල්ලේදීම දෙවියන්වහන්සේ යෝසෙප් සමග සිටි සේක.

...............................................................................................

**ජිවිතයට අදාල කිරීම**
ආදර දුවේ පුතේ. දෙවියන්වහන්සේ ඔබට ආදරෙයි. ඔබත් දෙවියන්-
වහන්සේට ආදරෙයිද ? (මෙහි ඔයාගේ පිළිතුර ලියන්න)
ඔයාට සිදුවෙන හැම නරක දේවල් ගැන හිතන්න. මිනිස්සු බනිනවා.
තියෙන දේවල් උදුරාගන්නවා. යාළුවන්'කොන් කරනවා. ඔයා ගැන
බොරු කියනවා. ඔයාගේ අම්මා තාත්තා නැතිවෙනවා.
මිනිස්සු අපහාස කරනවා. ඒත් දෙවියන්වහන්සේ ඔබට ආදරෙයි නම්,
ඔබත් දෙවියන්වහන්සේට ආදරෙයි නම් මේ හැම දෙයක්ම තුළින් අපිට
යහපත් දේ කරන්න දෙවියන්වහන්සේ අපි සමඟ ඉන්නවා.